00088

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)උපාධි වැඩසටහන - 2017/2018

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018

තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු - ESU3240/SNU5540

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.12.02 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "තුලනාත්මක අධ්‍යාපනය" යන පදය නිර්වචනය කරන්න.

02. බහුවිධ සමාජයක භාෂා ප්‍රතිපත්තියක් තිබීමේ වැදගත්කම සඳහන් කරන්න.

03. 1944 දී එක්සත් රාජධානියේ පනවන ලද අධ්‍යාපන පනතේ (බටලර් පනත) වැදගත්කම පැහැදිලි කරන්න.

04. සංවර්ධිත රටවල් තම අධ්‍යාපන පද්ධතීන් සංවර්ධනය කිරීම සඳහා වර්තමානයේ ගෙන ඇති නව්‍ය ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

05. ශ්‍රී ලංකාවේ ලන්දේසි අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න.

06. 1829 - කෝල්බෘක් කොමිසම විසින් අධ්‍යාපනය පිළිබඳව ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහන් කරන්න.

07. 1932 ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමයේ (හන්දෙස්ස ක්‍රමයේ) වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

08. 1939 අධ්‍යාපන ආඥාපනතින් නිර්දේශ කරන ලද "හෘද සාක්ෂි" වගන්තියෙන් අදහස් කරනුයේ කුමක් ද?

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පහත තනතුරු දරන්නන් විසින් තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමේ වැදගත්කම විභාග කරන්න.

a. අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයින්

b. අධ්‍යාපන පරිපාලකයින්

c. ගුරුවරුන් (ලකුණු 12)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා තුලනාත්මක අධ්‍යාපනය දායක කර ගැනීමේ දී මතුවන ගැටලු දෙකක් **(02)** විශ්ලේෂණය කර එම ගැටලු මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

10. (i) පැරණි ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ව්‍යුහය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පැරණි ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමයේ පැවති යහපත් පරිචයන් දෙකක් **(02)** සඳහන් කර වර්තමාන ශ්‍රී ලාංකික අධ්‍යාපනයට එහි අදාළත්වය විභාග කරන්න. (ලකුණු 08)

11. (i) "ගෝලීයකරණය" යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලාංකික අධ්‍යාපනයට ගෝලීයකරණය තුළින් සිදු කරන ලද බලපෑම විභාග කරන්න. (ලකුණු 08)

(iii) ගෝලීයකරණයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට කරන ලද ධනාත්මක බලපෑම තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි උපායමාර්ග විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

12. (i) 1943- අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව විසින් එවකට පැවති අධ්‍යාපනය පිළිබඳව ඉදිරිපත් කරන ලද දුර්වලතා සඳහන් කරන්න.
(ලකුණු 04)

(ii) 1943 - අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහන් කරන්න.
(ලකුණු 08)

(iii) 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සමකාලීන සමාජයට කරන ලද බලපෑම විභාග කරන්න.
(ලකුණු 08)

13. (i) සංවර්ධනය යන සංකල්පය කාලානුරූපව විකාශය වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(ii) අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් දියුණු වෙමින් පවතින රටවල් මුහුණපාන ගැටලු දෙකක් **(02)** විභාග කරන්න. උදාහරණ දෙකක් **(02)** සඳහන් කරන්න.
(ලකුණු 08)

(iii) ඉහත සඳහන් ගැටලු මඟහරවා ගැනීමට පහත කණ්ඩායම්වලට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

a) අධ්‍යාපන පරිපාලකයන්
b) විදුහල්පතිවරුන්
c) ගුරුවරුන්
d) දෙමාපියන්

(ලකුණු 08)

14. පහත මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

(ii) ජපානයේ ද්විතියික අධ්‍යාපනය

(iii) එක්සත් රාජධානියේ ද්විතියික අධ්‍යාපනයේ ගැටලු

(iv) බහුවිධ සමාජයන් හි අධ්‍යාපනය

(ලකුණු 05 x 4 = 20)

හිමිකම් ඇවිරිණි.

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF EDUCATION

BACHELOR OF EDUCATION (SPECIAL NEEDS EDUCATION)

DEGREE PROGRAMME 2017/2018

LEVEL - 05

FINAL EXAMINATION 2018

ESU3240/SNU5540 – COMPARATIVE EDUCATION AND EDUCATIONAL PROBLEMS

DURATION – THREE (03) HOURS

| Date: 02.12.2018 | Time: 01.30 p.m. – 04.30 p.m. |
| --- | --- |

**Answer All Questions in Part I and any three (03) Questions from Part II.**

## PART - I

01. Define the term "Comparativ Education".

02. State the importance of having a language policy in a plural society?

03. Explain the importance of 1944 Education Act (Butler Act ) in UK.

04. State **five (05)** innovative measures taken by the developed countries to enhance their education system at present.

05. Explain **two (02)** features of Dutch system of Education in Sri Lanka.

06. State the recommencations made by the 1829 Colebrooke Commission on Education.

07. Briefly explain the importance of the Rural Education Scheme (Handessa Scheme) in 1932.

08. What is meant by the Conscience Clause' recommended in the Education Ordinance in 1939?

(05 x 8 = 40 marks)

## PART - II

09. i. Examine the importance of studying comparative education by the following designations.
    a. Educational Policy Makers
    b. Educational Administrators
    c. Teachers.

(12 marks)

ii. Analyse **two (02)** problems in using Comparative Education to develop the National education System in Sri Lanka and make suggestions to overcome the problems mentioned.

(08 marks)

10. i. Explain the structure of educaton in ancient Sri Lanka.

(06 marks)

ii. State **three (03)** characteristics of education in ancient Sri Lanka.

(06 marks)

iii. Examine **two (02)** best practices in education in ancient Sri Lanka and its relevance to the present Sri lankan Education.

(08 marks)

11. i. What is meant by "Globalization"?

(04 marks)

ii. Examine the impact made by the Globlization on Sri Lankan education?

(08 marks)

iii. Analyze the strategies to be implemented in order to further strengthen the positive impact made on Sri Lanakn education by globalization.

(08 marks)

12. i. State the shortcomings of the existed systemof education identified by the 1943 Special Committee on Education.

(04 marks)

ii. State the recommendations made by the Special Committee on Education in 1943.

(08 marks)

iii. Examine the impact of the recommndations made by the Special Committee on Eduation in 1943 to the contemporary society?

(08 marks)

13. i. Briefly expalin how the concept of development evoled evolution timely.

(04 marks)

ii. Examine **two (02)** problems faced by the developing countries on quality of Eduation. State **two(02)** examples.

(08 marks)

iii. Explain how the following stake holders could contribute to overcome the problems mentioned above:

a. Educational Administrators.
b. School Principals.
c. School Teachers
d. Parents.

(2 x 4 = 8 marks)

14. Write notes on the following.

i. 1972 Educational Reforms in Sri Lanka.

ii. Secondary Education in Japan

iii. Educational Problems in Secondary Education n the United Kingdom.

iv. Education in multi-ethic societies.

(5 x 4 = 20 marks)

*-Copyerights reserved-*